# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 51 දරන
# සමූපකාර සේවක කොමිෂන් සභා
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1992 නොවැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් විශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 51 දරන සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 23/91

**1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 51 දරන සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1972 අංක 12 දරන පනතේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 39 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"සමුපකාර සමිති සහ ඒ වාගේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනත අදාළවීම.

39. (1) යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත් නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ කාර්මික ආරාවුල් පනතේ 31ආ වගන්තිය යටතේ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, එම පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් භාර නොගත යුතු ය.

(2) කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත් නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැක.